


## Children's Corner

## පිටිසර ගම

කෙත්යායෙන් වට වූ මේ ගම්මානේ
මඳ සුළඟින් නිතරම සෙදී යන්නේ
තරමක් පිටිසර වුව ද මේ ගම්මානේ
සුන්දර බවින් නෑ අඩුවක් දැනෙන්නේ

ගම කෙළවර ඇත්තේ මහ කන්දක්ය
ඉන් ඔබ්බට පිහිටියෙ මහ කැලයක්ය
තව කොනකින් ඇත්තේ දියඇල්ලක්ය
ඈතට පෙනේ කිරිදහරක් ලෙසට මෙය

කඩමණ්ඩිය පිහිටියේ ගම කෙළවරය
මේ හැම දෙනා කවුරුත් හරි සමගීය
ගමේ සිටින මිනිසුන් හරි එඩිතරය
මේගම දිනෙන් දින දියුලන පහනක්ය

♦ *දමිත් චතුරංග ගලගොඩ*
*මහාබෝධි මහා විද්‍යාලය*
*අනුරාධපුරය* Sri Lanka

## උදෑසනක්!

ගස උඩ සිටි රතු කුකුළා
බිමට බැහැල තටු ගසලා
කොක් කොක්කෝ කියාලා
අවදිවන්න අණ කරලා


කිරියගෙ පොඩි සුදු පැටියා
මූණ කටත් සෝදාලා
අම්මාගෙන් කිරිබීලා
දඩයමකට ඉව අල්ලා
කුරුමානම වැරදීලා
කැරපොත්තා පැන දුවලා

අප්පච්චිගෙ මුර සෙබළා
එළිවෙනකම් නිදි මරලා
බූරු ඇඳේ යටට වෙලා
තවමත් නිදි ගුළිගැහිලා

♦ *දේශාන් පෙරේරා*
**නාලන්දා විදුහල කොළඹ**

**Send your poetry and short essays to this Children's Corner by post, fax or e-mail. ඔබෙ ලිපි හා කවි තැපෑලෙන් හෝ පැක්ස් මගින් අප වෙත එවන්න**

## Postman Cat ලියුම් බෙදූ බළලා



Cats were used as a novel way to deliver the post in 19th century Belgium. 37 cats were trained to take mail to villages within 20 miles of Liege city centre in 1879. However, the experiment soon abandoned because letters rarely made it to the right house - the cats were too undisciplined.

**19** වන සිය වසේ බෙල්ජියමේ තැපැල් සේවයේ අපූරු වෙනසක් සිදු කරන ලදී. එනම් ලියුම් බෙදීම සඳහා බළලුන් යොදාගැන්මට තීරණය කිරීමයි. ඒ අනුව 1879 දී ලීග් නගර මධ්‍යස්ථානය වටා සැතපුම් විස්සක් ඇතුළත ලියුම් බෙදීම සඳහා බළලුන් 32 ක් පුහුණු කර යවන ලදී. එහෙත් ඉතා ඉක්මනින් ඒ ක්‍රියාව නතර කර දමන්නට තැපැල් දෙපාර්තමේන්තුවට සිදුවූයේ ඒ එකද ලියුමක්වත් ලැබිය යුතු ගෙදරට නොලැබුණු නිසාය. හේතුව බළලුන් කිසිම විනයක් නැති හිතුවක්කාර සතුන් කොටසක් වීමයි.

♦ *Auntie Ramani* (*රමණී නැන්දා*)

## උතුම් දෙයක් පවසමි මම

මගෙ හද පත්ල ගැඹුරුයි මට ඊට වඩා
කුරුළු කොබෙයි ඉගිලෙති නද ගීත ගයා
අහස් මාලිගා තැනුවත් ලොවට වඩා
උතුම් දෙයක් පවසමි මම ඊට වඩා

වතුර මිදියි කියමින් දන ලතැවෙන් නේ
වැස්ස නැති නිසා ඉන්නේ හඬමින් නේ
හේතුව මම දනිමි හොඳ හැටි පවසන් නේ
පිළිතුර මෙයයි ඇයි මේ ගස් වනසන් නේ

♦ **චමී අමල් කසිත්**
**විජයබා ජාතික පාසැල**
**ශ්‍රී ලංගම** Sri Lanka



නව ඇරඹුමක්
BANK OF CEYLON (UK) LTD
BOC
Gateway to Sri Lanka
BANK OF CEYLON (UK) Ltd.
ඔබගේ සියලුම බැංකුකරණ කටයුතු සඳහා
දැන් විවෘතයි...!
■ ඉතිරිකිරීමේ ගිණුම්
■ ජංගම ගිණුම්
■ ස්ථාවර තැන්පතු
■ ළමා ඉතිරිකිරීමේ ගිණුම්
■ ආයතනික ගිණුම්
■ ලංකා බැංකු ගිණුම් හිමියන් සඳහා නොමිලේ මුදල් පැවරුම්
■ පුද්ගලික හා ආයතනික ණය පහසුකම්
■ ආනයන/අපනයන මූල්‍යකරණය
■ භාන්ඩාගාර සේවාවන්
■ විදේශ විනිමය සේවාවන්
■ සංචාරක කටයුතු සඳහා බැංකු සේවාවන්
ලංකා බැංකුවේ ශාඛාවක් ලෙස ක්‍රියාත්මක වූ අප දැන් එක්සත් රාජධානියේ, ස්වාධීන බැංකුවක් ලෙස ස්ථාපනය කර ඇති බව සතුටින් දැනුම්දෙමු.
BANK OF CEYLON (UK) LTD
BOC
Gateway to Sri Lanka
1 Devonshire Square, London EC2M 4WD,
Tel: 020 7377 1888 Fax: 020 7377 5430
Email : info@bankofceylon.co.uk Web : www.bankofceylon.co.uk
Nearest Tube: Liverpool Street
(Bank of Ceylon(UK)Ltd is 100% owned by Bank of Ceylon, Sri Lanka)
Bank of Ceylon (UK) Limited is authorised and regulated by the Financial Services Authority
(FSA Referance No: 514744)
Registered in England and Wales(Company Registration No:06736473).
Registered address and Head Office: 1 Devonshire Square,London EC2M 4WD


## මා කැමති ඔබ කැමති ❊ ගීයක්

# කළුගලක් මෙතරම් සියුමැලි විය හැකිද?

### *කලාකරුවාගේ පරිත්‍යාගය කොතරම්දැයි කියන සුනිල් ගේ නවතම ගීතය*



*විශාරද සුනිල් එදිරිසිංහ*



*රාජි වසන්ත වෙල්ගම*

**මේ** ගීතය මෑතකදී මට අසන්නට ලැබුණේ අහම්බෙනි. සුනිල් එදිරිසිංහයන්ගේ නවතම ගීතයකැයි මෙය මට මගේ මිතුරෙක් එවා තිබුණේය. එය ඇසූ මනතින් ගීතය මගේ හද බැඳගත්තේ මා කවදත් ඇළුම් කරන සුනිල්ගේ ගායනා මහිමයට මෙන්ම මෙහි පදමාලාවේ ඇති නැවුම් බවටය. එසේම සංගීත සංයෝජනය ද වචන කියාපාන අදහස උද්දීපනය කරන ආකාරයට අපූර්ව ලෙස යෙදී ඇත.

මෙම ගීය අසන විට දැඩි උපේක්ෂාවක් අසන්නා තුළ උත්පාදනය වෙයි. එය අමතන්නේ අපේ සිංහළ කලාකරුවාට ය. මෙය අප අපේ අතීත සෞභාගයය වෙත යන ගමනක් වැන්න. රජරට යන කෙනෙකුට අපේ පැරණි කලාකරුවන්ගේ විශ්මය දනවන කැටයම් හා අලංකාර ගොඩනැගිලි වෙහෙර විහාර ආදියෙහි නටබුන් හමුවෙයි. ඒ ශ්‍රී විභූතිය මනසින් ස්පර්ශ කරන්නට අපට හැකිය. ඒ සියල්ල තුළින් අපට හමුවන කෙනෙක් වෙති. ඒ අදීන සිංහළ කලාකරුවාය.

ඔහු ගල්කටුවක් හා කුඩා මිටියක් ගෙන කරන ලද විස්කම් වැඩ අදත් අප මවිතයට පත්කරවයි. එහෙත් ඒසා විසල් කාර්ය යන්හි යෙදුණු ඔහු යෝධයෙකු නොවේ. සාමාන්‍ය ප්‍රමාණයේ

**මේ තරම් සියුමැලි ද කලුගල්**
**සිතන්නටවත් බැරි නිසා**
**මම ගියා අවුකන බුදුන්ටත්**
**දෑස් දුන් මිනිසා සොයා**

**කලා වැව ළඟ ඉලුක් හෙවනක**
**මැටි පිලක පැදුරක් එළා**
**රිදුම් පිරිමදිමින් බලයි ඔහු**
**මැරෙන ඉපදෙන රළ දිහා**

**ඉසුරුමුණියේ නුඹ තැනූ**
**පෙම්බරිය කොතැනද කියා**
**මා ඇසූ විට හිනැහුණා ඔහු**
**තවම තනිකඩ යයි කියා**

**ගායනය - විශාරද සුනිල් එදිරිසිංහ**
**පද රචනය - රාජි වසන්ත වෙල්ගම**
**සංගීතය - රුවන් දර්ශන දිසානායක**

මිනිසෙකි. ඔහුගේ නිර්මාණ අතර අපේ වඩාත් හිතට සමීප නිර්මාණය ඔහු මැවූ ඉසුරුමුණි පෙම් යුවලයි. සැබැවින්ම මේ යුගයේ අපට ඔහු හමුවිය නොහැකිද? සුනිල් එදිරිසිංහයන් අප ගෙන යන්නේ ඒ කලාකරුවා මුණගස්සා වන්නට ය.

කලුගලක් මේ තරම් සියුමැලි විය හැකිදැයි ගීතය ලියූ කවියා සිතයි. මැටි පිඩකින් කිසිවක් නෙලන්නට අපහසුවක් නැත. එහෙත් හැඩි දැඩි ගලකින් පෙම්වතුන් යුවලක් කැටයම් කරද්දී ඒ ගල මැටි පිඩක් මෙන් සියුමැලි වීදැයි ඔහු අසයි. එය සිතන්නට වත් බැරිය. ඒ නිසා ඔහු ඒ කලාකරුවා සොයා රජරට යයි. ඒ ගිය කල්හි ඔහුට ඒ අතීත කලාකරුවා හමුවෙයි. කලාකරුවාණෝ කලා වැව අසබඩ කුඩා පැළක මැටි පිළක පන් පැදුරක් එළාගෙන එහි හිඳගෙන තනිවම සිටියාහ. මහන්සියට රිදෙන තම අත් පා පිරිමදිමින් ඔහු කලා වැවේ රළ ගසන හැටි බලා සිටියේ ය. ඒ රළ පහර අනිත්‍යය ගැන ද පාඩමක් උගන්වනවා වැනි ය.

ඉසුරුමුණි තරුණිය එය මැවූ කලාකරුවාගේ පෙම්වතිය විය නොහැකිද? ඇය දැන් කොහිදැයි ඔහුගෙන් ඇසූ කල ඔහු හිනැහුණා මිස ඒ පිළිබඳ විස්තරයක් කීවේ නැත. ඒ වෙනුවට ඔහු සිනාසී කීවේ තමා තව ම තනිකඩ බව ය. ඒ පිළිතුරෙන් කුමක් අපට සිතාගත හැකි ද?

කලාකරුවා යනු සියල්ල ලොවට පරිත්‍යාග කරන්නෙකු මිස කිසිවක් බලාපොරොත්තු නොවන්නෙකි. ඔහු කිසිවෙකු හා වෛර බඳින්නෙකු නොවේ. කිසිවක් ඔහුට කිසිවෙකු ගෙන් අවශ්‍යද නොවේ. අදීන කලා කරුවායයි කියන්නේ එවැන්නාටය. අතීතයේ අප රටේ සිටි සියළු කලාකරුවෝ එවැන්නෝ වූහයි මම සිතමි. සුනිල්ගේ මේ නවතම ගීතය ඒ කල්පනය තහවුරු කරයි.

මේ ගීයේ පද රචකයාද සංගීත ඥයා ද නව පරපුරේ තරුණයෝ දෙදෙනෙක් වෙති. එහෙත් ඔවුන්ට මුහුකුරාගිය ඥාන දර්ශනයක් සැබැවින්ම තිබෙන බව මේ නිර්මාණය දෙස් දෙයි. ඉදිරියට ඔවුන්ගෙන් අපේ අනන්‍යතාව සුරකින තවත් මෙවන් නිර්මාණ බිහිවේවායි! පතමි.

♦ *දයා ආනන්ද*



*රුවන් දර්ශන දිසානායක*


**Srilanka Information Sites ශ්‍රී ලංකා තොරතුරු අඩවි**
**www.srilankans.com www.srilankatours.co.uk www.srilanka-holidays.co.uk**